මහින්ද ගේ ගමන

පී එල් නවීන් මනෝ එක්වෙයි ද?

කාශ්‍යප මල්ලවාරච්චි

රටේ නායකයා හෙවත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයටද පත්ව ඇත. එය ඔහුට පක්ෂය වෙනුවෙන් මෙන්ම රට වෙනුවෙන් දේශපාලන තීන්දු තීරණ ගැනීම පහසු කිරීමකි. රටේ නායකයාට පක්ෂයේ නායකත්වය හිමිවී නොතිබීම, එසේත් නැතහොත් රටේ නායකයා සහ පක්ෂයේ නායකයා වශයෙන් දෙපළාත් කටයුතු කිරීම, රාජපක්ෂ මහතාට පක්ෂය වෙනුවෙන් මෙන්ම රට වෙනුවෙන් සමහර තීන්දු තීරණ ගැනීමේදී බාධාවක්ව ඇති බව එම පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මෙන්ම කණිෂ්ඨ නායකයින් බොහෝ අවස්ථාවලදී පවසා තිබුණි. රාජපක්ෂ මහතා පක්ෂ නායකත්වයට තෝරා පත්කර ගැනීමත් සමගම එම බාධකය දැන් ඉවත්ව ගොසිනි.

මහින්ද රාජපක්ෂ මහතා, රටේ නායකත්වයට පත්වීමෙන් පසුව එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මෙන්ම ජාතික වශයෙන් නමක් දිනා සිටි එම පක්ෂයේ ප්‍රබල පෙළේ දිස්ත්‍රික් නායකයින් වන කෙහෙලිය රඹුක්වැලේ, මහින්ද සමරසිංහ වැනි මන්ත්‍රීවරුන් ආණ්ඩුවට එක්කර ගනිමින් ආණ්ඩුවේ අමතිලුටු භාර දෙමින් සැලකියයුතු වගකීම් කොටසක් පවරා ඇත.

මහින්ද රාජපක්ෂ මහතා රටේ නායකයා මෙන්ම පක්ෂයේ නායකයා බවට පත්වීමෙන් පසුව එක්සත් ජාතික පක්ෂයේ තවත් ජ්‍යෙෂ්ඨයින් ගණනාවක් ආණ්ඩුවට එක්වීම සඳහා නොයිවසින්ලෙන් සිටින බවක් පෙනෙන්නට තිබුහද රාජපක්ෂ මහතා ඔවුන්ව ආණ්ඩුවට එක්කර ගැනීම සඳහා එපමණ ඉක්මන් නොවන බවක් පෙනෙන්නටද විය. කෙසේ වුවද රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුසන්ත පුංචිනිලමේ මහතා ආණ්ඩුවට එක්වීමත් සමග එක්සත් ජාතික පක්ෂය නැවතත් සලිත වූ බවක් දක්නට ලැබුණු අතර තවදුරටත් සිය පක්ෂයේ මන්ත්‍රීවරු ආණ්ඩුවට බිලි බා ගන්නේ නම් එජාපය සර්ව පාක්ෂික සමූළුවකට සහභාගිවීම පිළිබඳව නැවතත් සලකා බැලිමට සිදුවන බවද එම පක්ෂ නායකයින් කිහිපවිටකදීම පවසා තිබුණි. එසේ වුවද නැවතත් මෑතකදී එනම් අනුරාධපුර දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ ජ්‍යෙෂ්ඨ නායකයකු මෙන්ම කිරිතිමත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ඩබ්ලිව්. බී. ඒකනායක මහතා මහාමාර්ග නියෝජ්‍ය ඇමැතිවරයා වශයෙන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය. ඊට අමතරව මහාචාර්ය පී.එල්. පීරිස්, නවින් දිසානායක, මනෝ විජේරත්න යන මහත්වරුද ආණ්ඩුව සමග මේ වනවිටත් ඉතාමත් සහයෝගයෙන් යුතුව කටයුතු කරමින් සිටිති.

ඊට අමතරව ජනාධිපතිවරයා ඇතුලු ඔහුගේ නියෝජිතයින් ලංකා කම්කරු කොංග්‍රසය, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, යනාදී පක්ෂවල නායකයින් සහ ජනතා විමුක්ති පෙරමුණ නායකයින් සමගද සම්කිසි සාකච්ඡාවක් කරමින් සිටි අතර ආණ්ඩුවට එක්වී මහින්ද චින්තන වැඩපිළිවෙල ශක්තිමත් කරමින් කටයුතු කිරීම සඳහා සිය නායකත්වය ලබා දෙන ලෙස ජනතා විමුක්ති පෙරමුණට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කිහිපවිටකදීම විවෘත ආරාධනාද කළේය. ජනතා විමුක්ති පෙරමුණ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනාවට ප්‍රතිචාර දක්වමින් මේ වනවිට එක්ව වැඩකිරීම පිළිබඳ ජනාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමට සිය කැබිනට් පළ කර ඇති අතර මේ වනවිට ඒ සඳහා නිල වශයෙන් එක් සාකච්ඡා වටයක් ද පවත්වා ඇත. එක්ව වැඩකළ හැකි ආකාරය සහ ඒ සඳහා තිබිය යුතු වැඩපිළිවෙළ කුමක්ද යන්න ජනතා විමුක්ති පෙරමුණ ජනාධිපතිවරයාට ලිඛිතව ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳ එම දෙපාර්ශවය අතර දෙවන සාකච්ඡා වටය මෙම සිකුරාදා (05 දා) නැවතත් පැවැත්වීමට නියමිතව ඇත.

පසුගිය පැවැති ප්‍රථම සාකච්ඡා වටය සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට සහභාගිවීමට නොහැකි වූ අතර ඒ සඳහා ජනාධිති උපදේශක බැසිල් රාජපක්ෂ මහතා ඇතුළුව තිමල් සිරිපාල ද සිල්වා, සුසිල් ප්‍රේම ජයන්ත්, අනුර ප්‍රියදර්ශන යාපා යනාදී ඇමතිවරු තිදෙනා ජනාධිපතිවරයා සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එම සාකච්ඡාවට සහභාගි විය. ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා යන මහත්වරු දෙපළ ඇතුලු ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ, අනුර කුමාර දිසානායක, කේ.ඩී. ලාල් කාන්ත යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද එම අවස්ථාවට සහභාගි වූහ.

ජනතා විමුක්ති පෙරමුණ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ශ්‍රීලපිනයට ඉදිරිපත් කළ වැඩපිළිවෙළ එම පක්ෂය තුළ සාකච්ඡා කර ශ්‍රීලනිප ස්ථාවරය ජවිපෙට දැන්වීමට නියමිතය. ජනාධිපති මහන්ද රාජපක්ෂ මහතා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ එම වැඩපිළිවලට එකඟ වන්නේ නම් ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවේ ඇමැතිධූර ඇතුළු වගකීම් භාර ගැනීමට කැබිනට්තෙන් සිටින බව එම පක්ෂ ආරංචි මාර්ගයෙන් අනාවරණය වේ. ජනාධිපතිවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සමග පවත්වන සාකච්ඡාවල සාර්ථක අසාර්ථකත්වය මත ජනාධිපතිවරයා පුමුඛ නියෝජිතයින් ලංකා කම්කරු කොංග්‍රසය සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගනෙනු ඇත. ජනාධිපතිවරයා සහ ආණ්ඩුවේ නියෝජිතයින් ජවිපෙ සමග කරන සාකච්ඡා සාර්ථක වන්නේ නම් ඔවුන් ලංකා කම්කරු කොංග්‍රසය කෙසේ වුවද ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සමග සාකච්ඡා නොකිරීමට පවා බොහෝදුරට ඉඩ ඇත. මන්ද ජවිපෙ ආණ්ඩුවට එක්වීමෙන් ආණ්ඩුව ශක්තිමත් වන්නේ නම් වෙනත් පාර්ශවයන් ආණ්ඩුවට එක්කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොගනී.

එසේ වුවද ජනවාර්ගික ප්‍රශ්නයට අවසන් දේශපාලන පිවත්වා ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළු පාර්ශවයන් සමග එකඟතාවයකින් කටයුතු කිරීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බලාපොරොත්තු වන බැවින් ජවිපෙ සමග සාකච්ඡා සාර්තකව එම පක්ෂය ආණ්ඩුව සමග එක් වුවද ජනාධිපතිවරයා ලංකා කම්කරු කොංග්‍රසය සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සමග ද සාකච්ඡා කිරීමට ඉඩ ඇති බව ආණ්ඩුව අත්‍යන්තර ආරංචි මාර්ග අනාවරණය කරති.

ජන වාර්ගික ප්‍රශ්නයට ලබාදෙන විසඳුම පිළිබඳ ස්ථාවරය එවන් එකඟතාවයකට ගැටවක්ව ඇතත් ආණ්ඩුව තුළ සිටින ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වැනි පක්ෂ දරණ ස්ථාවරයන්ට අතත්‍යව එම සුළු පක්ෂවලට ආණ්ඩුව සමග එක්ව කටයුතු කිරීමේ නොහැකියාවක් පවතින බව එම සුළු පක්ෂ දෙකේ ජ්‍යෙෂ්ඨ නායකයින් මෙන්ම ආණ්ඩු හිතවාදී විචාරකයින්ගේද අදහස වේ. ජාතික ප්‍රශ්නයට ලබාදෙන විසඳුම සම්බන්ධයෙන් ආණ්ඩුව අත්‍යන්තරයේ සංවාදයක් පැවතීම ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සුභවාදී බලපෑමක් ඇති කිරීමට සමත් වන බවද ඔවුහු විශ්වාස කරති. කෙසේ වුවද ඊට අදාලව ජවිපෙ සමග ආණ්ඩුව ඇති කර ගන්නා එකඟතාවය හා ස්ථාවරය, ආණ්ඩුව ඇති කර ගැනීමට බලාපොරොත්තු වන අනෙකුත් එකඟතාවයන් සඳහා මෙන්ම ඉදිරි කටයුතු සඳහා තීරණාත්මක බලපෑමක් කරන බව පමණක් පැහැදිලි කාරණයකි.

ජනවාර්ගික ප්‍රශ්නය සඳහා අවසන් දේශපාලන විසඳුමක් අතර කර ගැනීමට තැත් කරන සර්ව පාක්ෂික සමූළුව විසින් එම විසඳුම සැකසීම සඳහා මේ වනවිට දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගේ සමන්විත කමිටුව සහ විශේෂයද කමිටුව වශයෙන් කමිටු දෙකක් පත්කර ඇති අතර එම කමිටු දෙකද රැස්වෙන්නේ ඒ සඳහා වන කටයුතු අරඹා ඇත. ඊට අමතරව සුදුසු විසඳුම සම්බන්ධයෙන් ජනතා අදහස් විමසීමටද ව්‍යවස්ථා කටයුතු අමාත්‍යාංශය තීරණ කර තිබේ. ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය කුමක්දැයි තීරණය කිරීම සඳහා එම පක්ෂ මධ්‍යඹ කාරක සභාව විසින් මීට මසකට පමණ පෙර පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින් දස දෙනෙකුගෙන් පමණ සමන්විත කමිටුවක්ද පත් කර ඇති අතර එම කමිටුවද මේ වනවිට දෙවරක් පමණ රැස්ව ඇති එම කමිටු වාර්තාව ඉදිරි මධ්‍යම කාරක සභා රැස්වීම් වාරයකට ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ.

දකුණේ දේශපාලන සාධක කෙසේ වුවද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරිත්වය සිය න්‍යාය පත්‍රයට අනුව තවදුරටත් පවත්වාගෙන යන බවද දක්නට ඇත. එම ක්‍රියාකාරිත්වය රටේ ආරක්ෂාවට මෙන්ම දේශපාලනය සඳහා කරන බලපෑම දිනෙන් දින උත්සන්න කරමින් සිටින ස්වභාවයක්ද දක්නට ඇත. එල්.ටී.ටී.ඊ. සංවිධානය කවදත් සිය යුදු දේශපාලනය මත සියළු තීන්දු තීරණ මෙන්ම කටයුතු කේන්ද්‍රගත කර ඇත. එය අද රියේ සිදුව ඇති දෙයක්ද නොව, එම සියළු තත්ත්වයන්ට තවදුරටත් සාර්ථකව මුහුණ දිය හැක්කේ දකුණේ දේශපාලන බලවේග කළමණාකරණය කර ගන්නා ආකාරයට හා ඒකමතියක් පවත්වා ගැනීමට තිබෙන හැකියාව මත පමණක්ම බව දකුණේ දේශපාලන ප්‍රධානීන් තවදුරටත් පසක් කර ගත යුතුව ඇත. රාජපක්ෂ සාධකය හමුවේ එක්සත් ජාතික පක්ෂය තවදුරටත් හීනවීමද වැළැක්විය නොහැකි ය. ■

---

4 වන පිටෙන්

ඔත්තුකරුවෙකුගේ මාර්ගයෙන් රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරු ලැබී තිබිණි. ඒ ගැන කරුණු එක්රැස් කරමින් සිටියදී මීට මාස තුනකට පමණ පෙර තිස්සමහාරාම පොලිසිය මඟින් රත්නම් තිරුමතිව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කෙරිණි. නමුත් සැක කටයුතු කිසිදු දෙයක් හෙළිකර ගැනීමට අපහසු වූ බැවින් අයව පසුව නිදහස් කෙරිණි. එහෙත් රාජ්‍ය බුද්ධි සේවය වැඩේ අත්හැරියේ නැත. අය පසුපසින් සිට තවදුරටත් තොරතුරු එක්රැස් කළේ බුද්ධි සේවයට සිය ඔත්තුකරුබාගෙන් ලැබුණු තොරතුරු පිළිබඳ හොඳ විශ්වාසයක් තිබුණු බැවිනි.

තිස්සමහාරාම මහසෙන්පුර එම නිවස තුළ රත්නම් තිරුමතිගේ නැගණියකඳ ජීවත් වූවාය. අය මානසික රෝගයකින් පෙළෙන කාන්තාවකි. එම නිවසේ රහසිගත ජීවිතයක් ගත කරමින් ජීවත් වන මරාගෙන මැරෙන කොට කත වූ "සුජා" ගේ පසුගිය ජූලි මස 14 වැනිදා වනවිට රාජ්‍ය බුද්ධි සේවයට වැදගත් තොරතුරු රාශියක් ලැබී තිබිණ. එබැවින් තවදුරටත් ප්‍රමාග නොවූ රාජ්‍ය බුද්ධි සේවය භාර නියෝජ්‍ය පොලිස්පති කීර්ති ගජනායක මහතා සිය ඔත්තු සගයන් සමග විශේෂ සාකච්ඡාවක් පවත්වා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකුගේ නායකත්වයෙන් යුත් ඔත්තු නිලධාරීන් පිරිසක් තිස්සමහාරාමය බලා පිටත්කර හැරියේය. තිස්සමහාරාම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.පී.එස්. කරුණාසිංහ ඇතුලු නිලධාරීන් පිරිස කොටිකත වාසය කළ නිවස වටලා සැකිසිඩ් කරළ දෙකක්, ජංගම දුරකතනයක්, ඇතුළු බඩු තොගයක් සමග අදාල පිරිස අත්අඩංගුවට ගත්හ.

රාජ්‍ය බුද්ධි සේවයේ (S.I.S.) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා සහ එහි "හනිෆා" නමැති ඔත්තු නිලධාරියා ඇතුළු පිරිස පොලිසිය ඇතුළේදීම අත්අඩංගුවට ගත් අයගේ මූලික ප්‍රශ්න කිරීමක් කර තොරතුරු ලබා ගත්හ. අනතුරුව වැඩිදුර පරීක්ෂණ සඳහා කොටිකත කොළඹ ත්‍රස්තවාදී විමසීම්ශන ඒකකයට (T.I.D.) භාර කෙරිණි. එම ඒකකය භාරව ඇත්තේ රහස් පොලිසිය භාර නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක මහතාටයි. එහි අධ්‍යක්ෂවරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි එච්.පී. විතුමසිංහ මහතා ක්‍රියා කරන අතර ස්ථානාධිපති ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂක සපරමාදු මහතා කටයුතු කරයි. ඔවුන් යටතේ එම පරීක්ෂණ පැවැත්වෙමින් තිබියදී කොට කතගෙන් තවත් වැදගත් තොරතුරු කිහිපයක් ප්‍රශ්න කර ලබා ගැනීම උදෙසා රාජ්‍ය බුද්ධි සේවයේ (S.I.S.) පොලිස් පරීක්ෂකවරයෙකු ඇතුළු කිහිපදෙනෙක් ජූලි මස 20 වැනිදා කොළඹ ත්‍රස්තවාදී විශේෂ විමර්ශන ඒකකයට ගියහ.

නමුත් එයට විශේෂ විමර්ශන ඒකකයහාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ඉඩ දුන්නේ නැත. අන්තිමට බුද්ධි අංශ පොලිස් පරීක්ෂකවරයා හිස් අතින් ආපසු ඒමට සූදානම් වූ අවස්ථාවේදී විමර්ශණ ඒකකයේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක් ඔහු සමග කතා කරමින් " ඔයගොල්ලෝ අල්ලපු අයගෙන් ඔබගොල්ලන්ට ප්‍රශ්න කරන්න දෙන්න නැත්තේ ඇයි? ඒක මාර වැඩක් නේ" යනුවෙන් විමසීමක් කර ඇත.

මෙය රටේ පළමු පුරවැසියා වන ජනාධිපතිවරයාව ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධ පරීක්ෂණයකි. එබැවින් මෙය ඉතා බරපතළ හා වැදගත් පරීක්ෂණයකි. එහෙයින් අදාළ පරීක්ෂණ අංශ උත්සාහ කළේ පරීක්ෂණ හරහා ජනාධිපතිවරයාගෙන් ලකුණු දමා ගැනීමේ තරගයකට ප්‍රවිශ්ඨ වීමේ ස්වරූපයක් දැයි ඇතැම් ඔත්තු නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීමට ලක් වී ඇත.

පොලිස් ඝෙත්තුයට සම්බන්ධ ඔත්තු අංශවල ඔළෙස කඹ ඇදිලි සහ ප්‍රශ්න මතුවී ඇති අවස්ථාවක සුද හමුදා රහස් තොරතුරු අංශයේද බෙලි කැපිලි උග්‍ර වී ඇත. බෙලි කැපිලිද්‍ර දරුණු ලෙසම බලපා ඇත්තේ යුද හමුදා රහස් තොරතුරු අංශයේ මේජර් සමන් වෙදගම (පී.ඒ.එස්. වෙදගම) මහතා වෙතය.

1985 දී යුද හමුදාවට බැඳුණු මේජර් වෙදගම මහතා 1989 සිට 2006 දක්වා යුද හමුදා රහස් තොරතුරු අංශයට සම්බන්ධව වසර 17 ක් සේවය කර ඇත. කොළඹ, යාපනය, මඩකළපුව, වව්නියාව ඇතුළු ප්‍රදේශවල සේවය කර ඇති ඔහු ඇතුළු ජ්‍යෙෂ්ඨ ඔත්තු අංශ නිලධාරීන් 8 දෙනෙක් හිටි අඩියේම පසුගියදා ඔත්තු අංශයෙන් ඉවත් කරනු ලැබිණි.

ඒ කොටි සංවිධානයේ න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් රජයේ නියෝජිතයින් සමග 2006 පෙබරවාරි මස 22 සහ 23 දිනවල ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති සාම සාකච්ඡාවලදී එම ඔත්තු නිලධාරීන් පිරිස දැඩි ලෙස විවේචනය කරමින් රහසිගත කරුණු ඇතුළත් වාර්තාවක් සාකච්ඡා මේසයට ඉදිරිපත් කිරීම නිසාය.

එහිදී මේජර් වෙදගම මහතාව බාලසිංහම්ගේ දැඩි දෝෂ දර්ශනයට ලක්විය. ඔහු "කරුණා අම්මාන්"

14 වන පිටට